# ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පය තුළ නිරූපිත වාමන රූප ස්ථානගත කිරීම පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර වාස්තුවිද්‍යා නිර්මාණ ආශ්‍රයෙන්)

එම්.පී.එන්.එන්. ජයසිංහ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
nimalshajayasinghe@gmail.com

**මුඛ්‍ය පද** - වාමන, වාස්තුවිද්‍යා, ගොඩනැගිලි , කැටයම්, අනුරාධපුර

## හැඳින්වීම

ලාංකේය වාස්තු විද්‍යා නිර්මාණයන් අතර ද්විතීයික සනයෙහි ලා සැලකිය හැකි සුවිශේෂී අංගයක් ලෙස වාමන රූප දැක්විය හැක. මේවා කැටයම් සහ මූර්ති යනාදී අවස්ථා ද්විත්වයෙන්ම හඳුනාගත හැකි අතර මෙම අධ්‍යනයේ දී අවදානයක් යොමු කරනු ලබන්නේ වාමන කැටයම් සම්බන්ධයෙනි. විශේෂයෙන්ම එවකට කලාකරුවාගේ අව්‍යාජත්වය, නිර්මාණශීලීත්වය සහ සෞන්දර්යය විදහා දක්වන අල්ප පිරිසකගේ අවධානයකට ලක් වූ නිර්මාණ විශේෂයක් ලෙස වාමන කැටයම් හඳුනාගත හැකිය. අනුරාධපුර සහ පොළොන්නරුව යන අවදීන්වල නිර්මාණයන් ආශ්‍රිතව බහුල වශයෙන් වාමන කැටයම් යොදාගෙන ඇත. ඒ අනුව ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පය තුළ වාමන රූප ස්ථානගත කර ඇති ආකාරය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වන අතර ඒ සඳහා අනුරාධපුරයේ පැරණි වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනයට ලක් කෙරුණි.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේද ලෙස යොදා ගැනුණි. එහි දී පළමුවෙන් ම බහිරව සංකල්යෙහි ප්‍රභවය හඳුනා ගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය කෙරුණු අතර පසුව ක්ෂේත්‍ර අධ්‍යයනයන් හරහා ස්ථානගත කිරීමේ ස්වභාවය හඳුනා ගනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ලාංකේය නිර්මාණ ශිල්පියා එක් රාමුවකට කොටු නොවී නිදහසේ සිය රුචි අරුචිකම් ඔබ්බවමින් කළ නිර්මාණ විශේෂයක් ලෙස වාමන රූප දැක්විය හැක. මිටි, ඉදිරියට නෙරන ලද විශාළ උදරය සහිත පොදු ලක්ෂණයන්ගෙන් යුත් මොවුන් ගණ සහ බහිරව වශයෙන් ද හඳුන්වනු ලබයි. භාරතීය හින්දු සංකල්පය මත ගොඩනැගුණු නිර්මාණයක් ලෙස මෙම වාමන කැටයම් හඳුනාගත හැකි වුවත් ලාංකේය නිර්මාණයන් අතරට එන විට එහි ආගමික ස්වරූපයෙන් බැහැරව යොදාගෙන ඇති බවක් හඳුනාගත හැක. ඒ අනුව ලෞකික සහ ආගමික යන ගොඩනැගිලි ද්විත්වයෙහි ම භේදයකින් තොරව ම මෙම වාමන කැටයම් යොදාගෙන ඇති අතර සමස්ථයක් වශයෙන් දැනට හමු වී ඇති පුරාවිද්‍යාත්මක දත්තවලට අනුව ස්ථාන 19-20 අතර ප්‍රමාණයක මෙම වාමන කැටයම් ස්ථානගත වී ඇත. එහි දී අනුරාධපුර වාස්තුවිද්‍යා අංග ආශ්‍රිතව කළ මෙම අධ්‍යනයේ දී එවැනි ස්ථාන 8ක් පමණ ප්‍රමාණයක් හඳුනාගත හැකි විය.

- මුරගල

මුරගල ආශ්‍රිතව දෙකාරයකින් වාමන රූප දැකගත හැකි අතර ඉන් එක් අවස්ථාවක් වන්නේ සම්පූර්ණ මුරගලෙහි සංඛ පද්ම බහිරවයන් දැක්වීමයි. එහි සමස්ථ අවකාශයම වාමනයින්ට ලබා දී ඇත. දකුණු මුරගලේ සංඛ ද වම් මුරගලෙහි පද්ම ද සටහන් කර ඇති අතර මෙම සංඛ සහ පද්ම යනු කුවේරගේ නිදන් ආරක්ෂා කරන බහිරවයන් ලෙස ප්‍රචලිතය. (මල්සිරි,4) අභයගිරි විහාරයේ දකුණු දොරටුවෙහි සහ විජයබාහු මාලිගය, විජයාරාමය ආශ්‍රිතව මේ

සඳහා නිදර්ශන වෙයි. අනෙක් අවස්ථාව වන්නේ නාගරාජ මුරගලෙහි පාමුල මෙම සංඛ පද්ම යන දෙදෙනා හෝ එක් අයෙකු දැක්වීමයි. අභයගිරිය, ජේතවනය, ථූපාරාමය මෙයට නිදසුන් වෙයි.

- කොරවක්ගල්

කොරවක්ගල් ඇතුල් පැත්තේ වාමන රූප කැටයම් කර ඇති බවක් දක ගත හැක. රුවන්වැලි සෑය හා ථූපාරාමය පංචාවාසයන්ගේ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි කොරවක් ගල් ආශ්‍රිතව හඳුනාගත හැකි අතර ඉසුරුමුණියෙහි ප්‍රධාන පියගැටපෙළ ආශ්‍රිතව ද හඳුනාගත හැක.

- කුළුණු හිස්

අභයගිරිය, ජේතවනය, ලෝවාමහාපාය කුළුණු හිස් ආශ්‍රිතව බහුලව වාමන කැටයම් හඳුනාගත හැක. නර්ථනයේ යෙදෙන සහ වාදනයේ යෙදෙන පිරිමි සහ කාන්තා යන දෙපාර්ශවයේ ම වාමන රූ මේවායෙහි අන්තර්ගත වෙයි. මෙහි දී විශේෂයෙන් ම සමමිතික බව කෙරෙහි අවධානයක් යොමු කර ඇති බවක් හඳුනාගත හැක.

- පියගැටපෙළ මුහුණත්

පියගැටපෙළෙහි සිරස් මුහුණත්වල බහුලව ම මෙම වාමන කැටයම් දැකගත හැක. සඳකඩපහණ හා මුරගල් යෙදෙන ස්ථානවල විශේෂ වෙයි. ජේතවනය, ඉසුරුමුණිය, විජයබාහු මාලිගය යන ස්ථානයන්හි දැකගත හැකි අතර අභයගිරියෙහි බිසෝ මාලිගා පංචාවාස සංකීර්ණයෙහි ප්‍රධාන ආවාසයෙහි පියගැටපෙළ මුහුණතෙහි නිර්මාණය කර ඇති වාමන රූපය ඉතා සුවිශේෂී ලක්ෂණයන්ගෙන් යුත් සියුම් කැටයමක් ලෙස හඳුනාගත හැක. මේවායේ එකිනෙකට වෙනස් භාවයන් මෙන්ම ඇඳුම් පැලඳුම් සහ ආභරණ හඳුනාගත හැකි අතර ඒවා උසස් ලක්ෂණයෙන් යුක්ත වෙයි. සමාන්තර දුරකින් නිර්මාණය කර ඇති මෙම වාමන රූප ලියැවැල් ආදියෙන් එකිනෙකකින් වෙන්කර ඇති බවක් හඳුනාගත හැක.

- චෛත්‍ය ආයක

චෛත්‍ය ආයකයන්ගේ ස්ථාන කිහිපයකම වාමන රූ හඳුනාගත හැකි අතර අනුරාධපුරය ආශ්‍රිතව ආයක තීරුවල මෙම කැටයම දැකගත හැක. මිහින්තලා බණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ මීට නිදසුනකි. මෙහි ආයකයේ මකර හිස් සහිත තීරුවට ඉහළින් වාමන රූප පෙළක් වෙයි. මීට අමතරව මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය, රුවන්වැලිසෑය වැනි ස්ථූපවල කල්ප වෘක්ෂය දරා සිටින වාමන රූ හඳුනාගත හැක.

- කැසිකිලි ආවරණ

ජේතවනයෙහි කෞතුකාගාරය තුළ කැසිකිළි ආවරණයක යෙදූ වාමන රූපයක් හඳුනාගත හැකි අතර මෙය වාමන රූපයකට වඩා වාමනී (කාන්තා) රූපයකට සමාන වෙයි. එහි නිරූපිත හිසකෙස්, ආභරණ, ඇඳුම් පැලඳුම් නිරීක්ෂණයේ දී එය පැහැදිලි වෙයි. ඒ අනුව එය කාන්තා වැසිකිළියක් ලෙස උපකල්පනය කළ හැක.

- බහිරව කොටු

අනුරාධපුරයෙහි අභගිරිය ස්ථූපයෙහි මෙවැනි ස්ථානයක් හමුවන අතර කුලතුංග ඒ පිළිබඳව දක්වන්නේ මෙසේය. අභයගිරි ස්ථූපයේ හතරැස් කොටුව හා දේවතා කොටුව අතර වෙනත් ස්ථූපවල දක්නට නොලැබෙන සිලින්ඩරාකාර තවත් කොටසක් නිර්මාණය කර තිබේ. එය හැඳින්වෙන්නේ බහිරව කොටුව නමිනි. (කුලතුංග, 2014:65-66) එක් එක් ව්‍යාජ කුළුණකින් නිර්මාණය කරන ලද අවකාශයක උක්කුටියෙන් හිඳ සිටින බහිරව රූපයක් බැගින් එහි නිමවා තිබේ.

- කැටයම් පුවරු

වාමන රූප ඇතුළත් කැටයම් පුවරු ඉසුරුමුණියෙහි කෞතුකාගාරයෙහි තැම්පත් කර ඇති අතර එහි කුවේර පිරිවරා සිටින වාමනයින් මෙන්ම නර්ථනයේ යෙදෙන වාමනයින්ගේ රූ දැකගත හැක.

මෙලෙස අනුරාධපුර ගෘහ නිර්මාණ ශිල්පය තුළ වාමන රූපයන් විවිධ ස්ථානයන්ගේ ස්ථානගත කර ඇති බවක් හඳුනාගත හැකි අතර පොළොන්නරුව යුගය වන විට මෙය තව තවත් වර්ධනය වී ගොඩනැගිලිවල වෙනත් ස්ථානයන්ගේ ද ස්ථානගත වී ඇති අයුරු හඳුනාගත හැක. කෙසේ වෙතත් මෙම වාමන රූපයන් හුදු කලා නිර්මාණයක් ම පමණක් නොව ස්ථානගත කිරීමේ ස්වභාවය අනුව ඉතා සියුම්ව නිරීක්ෂණය කිරීමේ දී යම් යම් භාවමය හැඟීම් නිරූපනය කිරීමක් බව නිගමනය කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

මල්සිරි.අයි.ඩබ්, ***ලාංකේය කැටයම් කලාවේ වාමන රූප පිබඳ සංෂිප්ත අධ්‍යනයක්,*** කතෘ ප්‍රකාශනයකි.

කුලතුංග.ටී.ජී, (2014). ***පුරාණ අභයගිරි විහාරය,*** මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.